**පිවිතුරු සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශය සඳහා කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම ව්‍යාපෘතිය - 2014**

පිවිතුරු සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශය සඳහා කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව 2011 අගෝස්තු 29 දින ඇතුලත් වූ අංක 9158 දරන ප්‍රදාන ගිවිසුමේ 11 (අ) හා (ආ) දරන වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ගිවිසුම්ගත ලිපිය අනුව, ලංකා විදුලි බල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රජාව සඳහා පිරිසිදු බලශක්ති ප්‍රවේශය වැඩි කිරීම සහ ලංකා විදුලි බල මණ්ඩලයේ පුහුණු හැකියාවන් හා සේවා සැපයීම වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. 2012 අප්‍රේල් ප්‍රදාන ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ (VII) 33 වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 142 කට සමාන ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.08 ක් වන අතර ඉන් ඇ.එ.ජ. ඩොලර් 873,975 ක් මූල්‍යායනය කිරීමට දිළිඳුකම පිටුදැකීමේ ජපන් අරමුදල (දිපිජඅ) අපේක්ෂා කරයි. තවද, ඇ.එ.ජ.ඩොලර් 211,200 ඊටීසී පවුන්ඩේෂන් විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2011 නොවැම්බර් 08 දින ආරම්භ වී මූලිකව 2014 නොවැම්බර් 08 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව එය 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ

තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ආරම්භක හා අවසාන ශේෂයන්, ආපසු ගැනීම් සහ අරමුදල් ගිණුමට බලපාන ප්‍රතිපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් නඩත්තු කරනු ලබන පොත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබේද සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂයන් එදිනට මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සංසන්දනය කර තිබේද

(ඉ) ඉදිරිපත් කර ඇති වියදම් ප්‍රකාශන, ප්‍රදාන ගිවිසුමේ විශේෂිත අවශ්‍යතා සමඟ ප්‍රතිපූරණ අයදුම්පත්වලට සහය දැක්වෙන ලෙස සාධාරණ ලෙස විශ්වාස කල හැකිද

(ඊ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්වාගණනය කරන ලද විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 පරිච්ඡේදයේ විස්තර කර ඇති කරුණු මත මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මේ දක්වා මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 පරිච්ඡේදයේ පෙන්වා දී ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණුකොට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ රාජ්‍ය කටයුතු පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කර ඇති වියදම් ප්‍රකාශන (එස්ඕඊ) ප්‍රතිපූර්ණ අයදුම්පත් සඳහා සාධාරණ ලෙස පිළිගත හැකි බවත්,

(ඇ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛය අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේ වුවද, ව්‍යාපාතියේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 22 දින වේ.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------

එකතුව රු.මිලියන 37.89 ක්වූ සේවා සම්බන්ධතා ගාස්තු සහ අනෙකුත් පරිපාලන පිරිවැය ඒවායෙහි ප්‍රාග්ධන ස්වභාවය සැලකිල්ලට ගැනීමකින් තොරව දේපල, පිරියත හා උපකරණ සහ කෙරීගෙන යන වැඩ යටතේ ප්‍රාග්ධනගත කර තිබුණි. තවද, ලංකා විදුලිබල මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව ප්‍රාග්ධන කාර්යයන්වල ශ්‍රමික, ද්‍රව්‍ය හා පොදු කාර්ය පිරිවැය සම්මත පිරිවැය ක්‍රමයට තීරණය කරනු ලබයි. කෙසේ වුවද, දේපල පිරියත, උපකරණ හා කෙරීගෙන යන වැඩවල ඇතුලත් සේවා සම්බන්ධතා ගාස්තු සත්‍ය දරන ලද පිරිවැය මත තීරණය කර තිබුණි.

#### 2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

------------------------------------------

ප්‍රදාන ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ ඇමුණුම 4 සී (10) කොටස අනුව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ ගණුදෙනු මණ්ඩලයේ අභ්‍යන්තර විගණක විසින් සමාලෝචනය කර අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | ඇ.එ.ජ. ඩොලර් | රු. මිලියන | රු. මිලියන | ඇ.එ.ජ. ඩොලර් | රු. මිලියන | ඇ.එ.ජ. ඩොලර් | රු.මිලියන |
| ආ.සං.බැ. | 1.08 | 142 | 94 | 0.29 | 38.39 | 0.29 | 38.38 |
| **එකතුව** | **1.08** | **142** | **94** | **0.29** | **38.39** | **0.29** | **38.38** |

### 3.2 භෞතික ප්‍රගතිය

සමාලෝචිත වර්ෂය තුල සේවා සම්බන්ධතාවයන් සිදුකිරීමට ඉලක්කගත කර තිබුණද ව්‍යාපෘතිය පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනට නව සම්බන්ධතා 595 ක් ලබා දී තිබුණි.